රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

UNIVERSITY OF RUHUNA, SRI LANKA

# සමාරාධනය

සහ

# උපාධි ප්‍රදානෝත්සව දේශනය

# PRESENTATION SPEECH

AND

# CONVOCATION ADDRESS

## ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවය

## FIRST CONVOCATION

**1986 මාර්තු 22**

22nd MARCH 1986

ශ්‍රවණාගාරය, වෛද්‍ය පීඨය, ගාල්ල

AUDITORIUM, FACULTY OF MEDICINE, GALLE

රුහුණ විශ්වවිද්‍යාලය
18 AUG 2011
පුස්තකාලය

G.A.J. Hemmal Library

# ගරු රොනල්ඩ් ජෝශප් ගොඩ්ප්‍රි ද මැල් මැතිතුමා

**හඳුන්වා ඉදිරිපත් කිරීම :**


රුහුණ විශ්වවිද්‍යාලයේ උප කුලපති

**මහාචාර්ය ජී. පී. සමරවික්‍රම**


කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්ස,

රුහුණ සරසවියේ නිර්මාතෘවරයා වූ ද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් හා ක්‍රම සම්පාදන ගරු අමාත්‍යවරයා වූ ද රොනල්ඩ් ජෝශප් ගොඩ්ප්‍රි ද මැල් මැතිතුමාගෙන් පොදුවේ ශ්‍රී ලංකාවටත් විශේෂයෙන් රුහුණ සරසවිය බිහිකිරීමෙහි ලා රුහුණටත් ඉටු වී ඇති විශිෂ්ට සේවාව ගැන සලකා බලා එතුමන්ට සාහිත්‍ය විශාරද උපාධිය සම්මාන වශයෙන් පිරිනැමිය යුතු යයි රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව හා පාලක සභාව, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, කෘෂිකර්ම, වෛද්‍ය, හා විද්‍යා යන සිව් පීඨයෙන් ම කරනු ලැබූ ඒකමතික නිර්දේශය අනුව තීරණය කොට ඇත. එම සම්මාන උපාධිය එතුමන්ට පිරිනැමීම සඳහා එතුමා මෙම සං-සදයට හඳුන්වා දී ඉදිරිපත් කිරීමට ලැබීම අපගේ අමන්දනන්දයට හේතු වෙයි.

රොනල්ඩ් ජෝශප් ගොඩ්ප්‍රි ද මැල් මැතිතුමා බොහෝ ඇසූ පිරූතැන් ඇත්තේය, ඉතා බුද්ධිමත්ය, අතිශයින්ම අවංකය, එඩිතරය, කථාව චතුරය. සියලු බාධක හමුවේ නොසැලී නිර්භයව අභියෝගයනට මුහුණ දීමට එතුමා කෙරෙහි ඇති අධිෂ්ඨාන ශක්තිය එතුමාගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණයකි. 1925 අප්‍රේල් මස 11 වැනිද ජන්ම ලාභය ලැබූ එතුමෝ ගල්කිස්සේ ශාන්ත තෝමස් විදුහලින් ස්වකීය ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සාර්ථක ලෙස සම්මාන සහිතව අවසන් කොට ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත්වී 1947 දී ඉතිහාසය පිළිබඳ ප්‍රථම පන්තියේ ගෞරව උපාධිය හිමිකර ගත්හ. තමා පෙනී සිටි සැම ප්‍රසිද්ධ විභාගයකින් ම ප්‍රථම ස්ථානය ලබා ගනිමින් සමත්වීම එතුමාගේ බුද්ධි මහිමය විදහා දක්වයි.

ලංකා විශ්වවිද්‍යාලයෙන් ඉතිහාසය පිළිබඳ ගෞරව උපාධියක් හිමිකර ගැනීමෙන් අනතුරුව එතුමා 'ජාත්‍යන්තර මූල්‍යය හා ජාත්‍යන්තර වෙළඳාම' යන විෂය ක්ෂේත්‍රය යටතේ ආචාර්ය උපාධියක් ලබා ගැනීම සඳහා එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි විය. එහෙත් ඒ අවධියේ ම එතුමා ශ්‍රී ලංකා පරිපාලන තන්ත්‍රයෙහි සුවිශේෂ වූ ලංකා සිවිල් සේවයට තෝරා ගනු ලැබූයෙන් එම පශ්චාත් උපාධිය පිළිබඳ අධ්‍යයනය අත්හැර දැමීමට එතුමාට සිදු විය.

1948 වර්ෂයේ දී ශ්‍රී ලංකා සිවිල් සේවාවට බැඳුනු ද මැල් මහතා රජයේ වැදගත් දෙපාර්තමේන්තු කිහිපයක ප්‍රධානියා වශයෙන් ද වැදගත් අමාත්‍යාංශ කිහිපයක ස්ථිර ලේකම්වරයා වශයෙන් ද සේවය කොට ඇත. ඒ සෑම තනතුරකට ම අයත් වගකීම් ඉතා කාර්යක්ෂම ලෙසත් උද්‍යොගීමත් ලෙසත් ඉටු කළ එතුමෝ එකී තනතුරු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම බැබලවූ අතර තුමූද එයින් ම කීර්තිමත් වූහ.

එසේ වසර තුදුසක උදර සේවාවකින් පසු 1962 දී එතුමා සිවිල් සේවාවට ආයුබෝවන් කියා රටට දැයට සේවය කිරීමේ මහත් අභිලාෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසුනේ තමන්ට නිසැකව ම හිමිවන්නට තුබූ වාසිදයක විශ්‍රාම වැටුප ද පුද කරමිනි. පිළිවෙළින් 1967, 1970 සහ 1977 යන වසරවල පැවති මහමැතිවරණ වලදී දෙවිනුවර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වූ එතුමා දැනට පාර්ලිමේන්තුවේ බුලත්සිංහල ආසනය නියෝජනය කරයි. 1977 දී මුදල් ඇමතිවරයා වශයෙන් පත් කරනු ලැබූ ද මැල් මහතා අද දක්වා ම එම තනතුර හොබවයි. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු මෙහි මෙතෙක් ඇති කරන ලද පුළුල් ආර්ථික හා මූල්‍යය වෙනස්කම් කිහිපයක ම නිර්මාතෘවරයා වූයේ ද ඒ මහතාය. ජාත්‍යන්තර සම්මේලන කිහිපයකදී ශ්‍රී ලංකාව නියෝජනය කළ එතුමා 1985 මැයි මාසයේදී ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති වශයෙන් ද තේරී පත් විය.

පෞද්ගලික ජීවිතයේ දී ද මැල් මහතා ශ්‍රී ලංකාවේ විශාලතම තේ සහ රබර් වතු කිහිපයක හා කාර්මික සමාගම් කිහිපයක අධ්‍යක්ෂ වරයකු වශයෙන් කටයුතු කර ඇත. ග්‍රාම සංවර්ධන සේවකයකු වශයෙන් ද ප්‍රමුඛ ස්ථානය ගෙන කටයුතු කළ මෙතුමා එක්දහස් නවසීය පණස් ගණන්වල සිට දිළිඳු අය වෙනුවෙන් ආත්මෝපාකාර පදනමක් මත ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ ශ්‍රී ලංකා ජාතික ශ්‍රමදාන සර්වෝදය ව්‍යාපාරයේ පුරෝගාමී හා ආරම්භක සාමාජිකයන්ගෙන් කෙනෙකු විය.

කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්ස,

ශ්‍රී ලංකා වාසී ජනතාවගේ ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳව මෙන් ම ජාත්‍යන්තර මූල්‍යය හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව හසල දැනුමක් ඇත්තා වූ ද, රුහුණේ විශ්වවිද්‍යාලයක් පිහිටුවිය යුතු යයි 1967 සිට පාර්ලිමේන්තුව තුළදී මෙන් ම පිටතදීත් මහත් උද්ඝෝෂණයක් කොට අවසානයේ ඈත අතීතයේදී මෙන් ම වර්තමානයේදීත් උගතුන්ගේ හා බුද්ධිමතුන්ගේ නිජ බිමක් වූ රුහුණු රටට සෑම ශ්‍රී ලාංකිකයකුගේ ම හිත සුව පිණිස සකලාංගයන්ගෙන් පරිපූර්ණ වූ මනස්කාන්ත විශ්වවිද්‍යාලයක් පිහිටුවා දෙනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් හා ක්‍රම සම්පාදනය පිළිබඳ ගරු අමාත්‍ය ධුරන්ධර රොනල්ඩ් ජෝශප් ගොඩ්ෆ්‍රි ද මැල් මන්ත්‍රීශ්වරයාණන්ට රුහුණ විශ්වවිද්‍යාලයේ සාහිත්‍ය විශාරද උපාධිය ( D. Litt.) සම්මාන වශයෙන් පිරිනමන ලෙස ඉතා ගෞරවයෙන් ආරාධනය කරමි.

ගරු මුදල් හා ක්‍රම සම්පාදන ඇමති

# රොනී ද මැල් මැතිතුමාගේ

## උපාධි ප්‍රදානෝත්සව දේශනය

කුලපති ස්වාමීන් වහන්ස, ගරුතර මහා සංඝයා වහන්ස,
උපකුලපතිතුමනි,
සනාථන සභා පාලක මණ්ඩලයේ සාමාජික මහතුනි,
පීඨාධිපතිවරුනි, මහාචාර්යවරුනි, කථිකාචාර්යවරුනි,
උපාධිලාභීනි, නෝනාවරුනි, මහත්වරුනි,

උපකුලපති තුමාගේ ආරම්භක දේශනයෙන් මා ගැන පැවසූ කරුණු ගැනත්, ඉතා දයාද්‍රවිතව ඔබ මා පිළිගත් ආකාරය ගැනත්, රුහුණ විශ්වවිද්‍යාලයේ සාහිත්‍යාශූරී සම්මාන ආචාර්ය උපාධිය පිරිනමමින් මා ඔබ අතුරින් කෙනෙකු වශයෙන් පිළිගැනීම ගැනත් මා අතිශය සතුටට පත්වූ බව සඳහන් කරන්නට කැමතියි.

ඔබ මා කෙරෙහි දක්වූ මෙම ගෞරවය සැමද මා අගය කරන්නේ රුහුණ විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා කරන ලද දීර්ඝකාලීන සටනේ පුරෝගාමියකුවීම නිසා පමණක් නොවෙයි. අප රටේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා සාමාජයීය ජන ජීවිතයේ උන්නතිය පෝෂණය කරමින්, වැදගත් සැම ක්ෂෙත්‍රයකම ලැබූ ජයග්‍රහණය අත්කර ගැනීමේදී රුහුණු දූ පුතුන් තුල පැවති අපරාජිත හැඟීම නිරූපණය වන ආයතනයක් විසින් මෙම ගෞරවය මට පිරිනමා තිබීම නිසාත් එම ගෞරවය මා අගය කරනවා.

ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධිත 1921 දී ලංකා විශ්වවිද්‍යාල ආයතනය පිහිටුවීමත් සමගම ශ්‍රී ලංකාවේ වර්තමාන උසස් අධ්‍යාපන ක්‍රමය ආරම්භ වුනු බව කියන්නට පුළුවනි. එම ආයතනය තමන්ගේම උපාධි පිරිනමන ජාතික විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය වීමට පුරා අවුරුදු විසි එකක් ගතවුනා. ඒ අනුව නියම වශයෙන් ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබුවෙ 1942 දීයි. බෞද්ධ අධ්‍යාපනයෙහි කේන්ද්‍රස්ථාන දෙකක් වූද, දීර්ඝ කාලීන අධ්‍යාපන පසුබිමක් ඇත්තා වූද විද්‍යාලංකාරය සහ විද්‍යොදය යන පිරිවෙන් ආයතන දෙක 1959 දී විශ්වවිද්‍යාල බවට පත් කළා. එය ආයතන දැන් හැඳින්වෙන්නේ කැළණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යන නම් වලිනුයි. මොරටුවේ කටුබැද්දේ පිහිටි ලංකා කාර්මික විද්‍යාලය 1972 දී විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කළා. ඉන්පසු එය 1979 දී මොරටුව විශ්වවිද්‍යාලය බවට පත්වුනා. එම වසරේදීම 1974 දී සිට ලංකා විශ්ව-විද්‍යාලයේ මණ්ඩපයක්ව පැවති යාපනේ මණ්ඩපය, යාපනය විශ්වවිද්‍යාලය වශයෙන් බිහිවුනා. ඔබේ මෙම විශ්වවිද්‍යාලය, එනම් රුහුණ විශ්වවිද්‍යාලය 1978 දී ආරම්භ වී 1984 දී විශ්ව විද්‍යාලයක තත්ත්වයට උසස් කරනු ලැබුවා. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන කටයුතු මෙම ආයතන පිහිටුවීමෙන් නතර වුනේ නැහැ. ඒවාට අමතරව අද අපට තිබෙනවා මඩකලපුව විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය, උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය, ශ්‍රීමත් ජෝන්-

කොතලාවල හමුද පුහුණු විද්‍යායතනය, සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ උපාධි පිරිනමන ආයතනයක්, සේවක අධ්‍යාපන ආයතන සහ දේශීය වෛද්‍ය ආයතනය. එපමණක් නොවෙයි. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන, කෘෂිකර්මය, පාලි හා බෞද්ධ ආයතනයක් අපට තිබෙනවා.

1979 කාර්මික අධ්‍යාපනය පිළිබඳ ඇනලිංගම් කමිටු වාර්තාවේ ප්‍රතිඵලයක් වශයෙන් අරමුදල් නොමැතිව එතෙක් අතපසු කොට තිබුණු කාර්මික අධ්‍යාපන අංශයට නව පණක් දෙනු ලැබුවා. එම කමිටුවේ නිර්දේශ හේතු කොට ගෙන නව කාර්මික ආයතන සහ අනුබද්ධ කාර්මික ඒකක පිහිටුවනු ලැබුවා. අලුත් පාඨමාලා හඳුන්වා දීමත්, පවත්නා පාඨමාලා වැඩි දියුණු කිරීමත් කරන ලද අතර ක්‍රමානුකූල සේවක මණ්ඩල වර්ධනයක් ද ඇති වුණා.

ශ්‍රී ලංකාව වැනි දියුණු වන්නාවූ රටකට ඉතාමත් සීමිත සම්පත් වලින් මෙතරම් විශාල උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාවක් පිහිටුවීමට හැකි වීම ඇත්තෙන්ම විශිෂ්ඨ ජයග්‍රහණයක්. මේ සඳහා වැඩි ප්‍රශංසාවක් හිමි විය යුත්තේ අතිගරු ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් ගේ රජයට බව පවසන්නේ මහත් අභිමානයෙන්. එපමණක් නොවෙයි, 1972 අංක 1 දරණ ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ පැවති යල් පැනපු නිළධාරි පාලනය ඉවත් කොට පරිපාලන ස්වාධීනත්වය සහ අධ්‍යයන නිදහස තැවත වරක් විශ්වවිද්‍යාලවලට ලබා දුන්නා. උසස් අධ්‍යාපනයද අපට උරුම වුණු ආර්ථිකය මෙන් අවුල් වෙලයි තිබුණේ. ඉගෙනීමේ කටයුතු නව ආලෝකයකින් යළි පණගැන්වී මේ රටේ අධ්‍යාපන රටාවේ උසස් අධ්‍යාපනයට හිමි තැන අත් වුණේ 1978 විශ්වවිද්‍යාල පනතට පසුවයි.

උසස් අධ්‍යාපනය දැන් ඉහළ පැලැන්තිවලට සහ පොහොසත් අයට පමණක් සීමා වෙලා නැහැ. ප්‍රාදේශීය වශයෙන් විශ්වවිද්‍යාල ව්‍යාප්ත වීම නිසා පහළ මැද පංතියේ සහ කම්කරු පන්තියේ නිවෙස් වලින් වැඩිවීමක් ශිෂ්‍ය සංඛ්‍යාවකට උසස් අධ්‍යාපනය ලැබීමේ අවස්ථා විවෘතව පවතිනවා. සීමිත ආයතන සංඛ්‍යාව සහ ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සීමාසහිත වීම නිසා මීට කලින් මෙම අවස්ථා ඔවුන්ට ඇහිරී තිබුනා. එපමණක් නොවෙයි. තමන්ගේ දූරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා මුදල් යෙදීමට නොහැකිවන්නට ඉඩ තිබුණා. වත්පොහොසත්කම් අඩු දෙමාපියන්ටත් ශිෂ්‍යත්ව සහ මුදල් ආධාර නිසා විශාල සහනයක් අත් වී තිබෙනවා.

මුල සිටම ජේ. ආර්. ජයවර්ධන රජය සෑම මට්ටමකම අධ්‍යාපනික කටයුතු සඳහා අයවැය ප්‍රතිපාදන වලින් සැහෙන කොටසක් වෙන් කළා. අපගේ ප්‍රශ්න වලට එකම විසඳුම වැඩි වැඩියෙන් රට සංවර්ධනය කිරීම නිසා, අපේ රටේ ඉතිහාසයේ එතෙක් මෙතෙක් විශාලතම සංවර්ධන වැඩසටහන අපි ආරම්භ කළා. අපේ තරුණ තරුණියන්ට රැකියාවල් ලබාදිය හැකි වන්නේත්, අපගේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවා ඔවුන් ජීවත්වන ආකාරය වැඩි දියුණු කළ හැකිවන්නේත්, අපේ රට සංවර්ධනය කිරීම මගින් පමණයි. එසේ වුනත් අධ්‍යාපන

යෙන් තොරව සංවර්ධනයක් ඇතිවිය නොහැකියි. අප සතු මිනිස් බලය අවශ්‍ය පරිදි පුහුණු කිරීමත්, අපංගේ සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීමත් කළ හැක්කේ අධ්‍යාපනය මගින් පමණයි. සෑම අවස්ථාවකම අපි එබඳු වැඩි අවධානයක් අධ්‍යාපනය කෙරෙහි යොමු කොට හැකි සෑම ආකාරයකින්ම එය වැඩි දියුණු කිරීමට අපගේ හිත සම්පත් යොදවා තිබෙන්නේ ඒ නිසයි.

මෙම අවස්ථාවේදී මා දක්වූ ඒ අදහස් සංඛ්‍යාවන් කිහිපයක් මගින් සනාථ කරන්නට මා කැමතියි.

සියලුම විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ලද මුළු සංඛ්‍යාව 1977 දී ශිෂ්‍යයන් 4,150 සිට 1986 දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6000 දක්වා වැඩි වී තිබෙනවා. 1977 දී ලියාපදිංචි කළ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 15,000 සිට 1986 දී 20,000 දක්වා වැඩිවී තිබෙනවා. විවෘත විශ්වවිද්‍යාලයේත්, උපාධි පිරිනමන ආයතනවල හා පශ්චාත් උපාධි ආයතනවලත් ශිෂ්‍ය සංඛ්‍යාව මෙයට එකතු කළොත් දනට එකීමුළු සංඛ්‍යාව 34,000 ක් පමණ වෙනවා. කාර්මික විද්‍යායතනවලට ඇතුළත් කර ගන්නා සංඛ්‍යාව 1979 දී 10,000 සිට 1986 දී 15,000 දක්වා වැඩිවී තිබෙනවා. මීට වඩා යමක් වෙනත් මොනම ආණ්ඩුවකටවත් කරන්නට පුළුවන්ද ?

උසස් අධ්‍යාපනය සඳහා දරන වියදම ගැන මා සඳහන් කරන්නට බලාපොරොත්තු වෙනවා. බටහිර රටවල මෙන් නොවෙයි ශ්‍රී ලංකාවේ, අධ්‍යාපන කටයුතු සඳහා සියලු අරමුදල් ලබා දෙන්නේ රජයයි. දනට මුළු අයවැයෙන් 7.5% ක් නැතිනම් රු. ද. ල. 5,200 ක් වෙන්කර තිබෙන්නේ අධ්‍යාපනය සඳහායි. මෙය පසුගිය රජය විසින් වෙන් කර දුන්, මුදල මෙන් දහ ගුණයක්, මේ වර්ෂයේ උසස් අධ්‍යාපනය සඳහා පමණක් දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 1000ක් වෙන් කර තිබෙනවා. 1978 දී අතිගරු ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ රජය බලයට පත් වූද සිට උසස් අධ්‍යාපනය සඳහා වෙන් කරන අරමුදල් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වී තිබෙනවා.

මෙතරම කෙටි කාලයක් ඇතුලත උසස් අධ්‍යාපනය වෙනුවෙන් දරණ වියදම වැඩිවීම මෙරට අධ්‍යාපන ඉතිහාසයේ පෙර නොවූ විරූ දෙයකි. මෙම මුදල් සම්භාරය මැනවින් වැය කර තිබෙනවාද කියා මොහොතකට විමසා බැලියයුතු කාලය දන් පැමිණ තිබෙන බවයි මගේ හැඟීම. එබඳු ඉමහත් බලාපොරොත්තු සහගත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේදී එයින් අප බලාපොරොත්තු වූ අරමුණු ඉටුවෙමින් පවතිනවාද ? උසස් අධ්‍යාපනය සංවර්ධිත අවශ්‍යතාවයන් සපුරාලනවාද? එසේ නොවන්නේ නම් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා එය වැඩි දියුණු කිරීමට වෙනත් මාර්ග තියෙනවාද? මෙම ආයතන වලින් බලාපොරොත්තු වුනු ප්‍රතිඵල ලැබෙන බවට අපි සෑහීමකට පත් වුනොත් මිසක අපගේ වර්තමාන අයවැය සීමා යටතේ මේ තරම් විශාල ධනස්කන්ධයක් තවදුරටත් දැරීමට අපට අමාරු බව ඔබ පිළිගන්නවා ඇත.

මේ රටේ උසස් අධ්‍යාපනය දැන් නිසි මඟට යොමුවී පවතින බවට පැහැදිලි සාක්ෂි තිබීම ගැන සතුටු වෙනවා. 1984 – 1988 කාල පරිච්ඡේදය ආවරණය වන විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සාමූහික සැලැස්මක් ප්‍රථම වතාවට දැන් සකස් කර තිබෙනවා. පසුගිය කාලයේ කලාව හා මානව විද්‍යාවන්ට දැඩි නැඹුරුවක් තිබුණ විශ්වවිද්‍යාල අධ්‍යාපනය විද්‍යාව, වෘත්තීය, කළමණාකාරිත්ව සහ ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රවලට යොමු කිරීමට රජයේ සැලැස්මෙන් බලාපොරොත්තු වෙනවා. උපාධි අපේක්ෂකයන්ට ඉගැන්වීම කෙරෙහි දැනට පවත්නා දැඩි අවධානය පශ්චාත් උපාධි ඉගැන්වීම හා පර්යේෂණ කටයුතු කෙරෙහි යොමු කරවමින් වඩාත් ඵලදායීව සම්පත් අන් අතකට යොමු කිරීමට ද සැලැස්මෙන් බලාපොරොත්තු වෙනවා. විශේෂඥ මධ්‍යස්ථාන පිහිටුවීමේ සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පීඨ විධිමත් කිරීම පිළිබඳ නව ආකල්පය ප්‍රශංසා කළ යුතුය. මේ සැමෙකක්ම පහළවූ හොඳ ලකුණු වන අතරම ඒවා විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සම්බන්ධ සැම කෙනෙකුම හැම අංශයෙන්ම දිරිගැන්විය යුතු වනවා.

රටේ අනාගත අවශ්‍යතා ඉටුවන ආකාරයට උසස් අධ්‍යාපනය ප්‍රතිශෝධනය කොට පුනරුත්ථාපනය කිරීමට අවංක ප්‍රයත්නයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරන බවට පෙනී යනවා. කෙසේ වුවද, ඉතාමත්ම කෙටි කාලයකින් අපගේ උසස් අධ්‍යාපනික අරමුණු ඉටුකර ගැනීමට නම් වැඩිපුර අවධානයක් අවශ්‍ය වන ඇතැම් අංශ තිබෙනවා. ඒවායින් සමහරක් ගැන යමක් සඳහන් කරන්නට අද මා බලාපොරොත්තු වෙනවා.

පසුගිය වසර ගණනාව තුළ මේ රටේ උසස් අධ්‍යාපනය යොමු වී තිබුණේ රාජ්‍ය අංශයට අවශ්‍ය මිනිස් බලය ලබාදීමටයි. පෞද්ගලික අංශය සාමාන්‍යයෙන් තමන්ගේ කාර්ය මණ්ඩලයට බඳවා ගන්නෙ කෙළින්ම පාසැල් වලින් නැත්නම් පෞද්ගලික අධ්‍යාපනික හා වෘත්තීය ආයතන වලිනුයි. මේ දිනවල අප වැඩියෙන් කතාකළ කරුණක් වන විසිඑක්වන සියවසට සාර්ථකව පිවිසෙන්නට නම් අපගේ විශ්වවිද්‍යාල පද්ධතියේ මෙතෙක් නොවූ විරූ පරිවර්තනයක් කළ යුතුව තිබෙනවා. පෞද්ගලික අංශයට දරන්න බැරි විශාල මූලික ව්‍යාපෘති රාශියක වැය රජය නිමකර තිබෙනවා. ඒ අතරම, සම්පත් ප්‍රයෝජනයට ගැනීමේදී ව්‍යූහමය වෙනස්කම් කළයුතු කාලය පැමිණ තිබෙන බව රජයට වැටහී තිබෙනවා. ඉදිරි වසර පහ සඳහා පොදු ආයෝජන වැඩ සටහනට රුපියල් දශලක්ෂ දහස් 291 ක මුළු දායකත්වයක් බලාපොරොත්තු වනවා. මෙයින් පෞද්ගලික අංශයේ කොටස රුපියල් දශ ලක්ෂ දහස් 136 යි. මෙහිදී වැදගත් දෙය පෞද්ගලික අංශයේ දායකත්වය ක්‍රමයේ වැඩිවීමයි. ඒ අනුව පොදු ආයෝජන වැඩ පිළිවෙල පස්වන වසරේදී පෞද්ගලික අංශයේ දායකත්වය රාජ්‍ය අංශයට වඩා වැඩිය.

අනාගතයේදී සංවර්ධන කටයුතු කඩිනම් කළ හැක්කේ පෞද්ගලික අංශයට වැඩි වගකීමක් පැවරීමෙන් බව රජය පිළිගෙන තිබෙනවා. රාජ්‍ය අංශය ඇතැම් කාර්මික සහ වානිජ ආයතන පෞද්ගලික අංශයට පැවරීමේ රජයේ ක්‍රියාදාමයෙන් මෙය වඩාත් තහවුරු වෙනවා. ඒ නිසා විසි එක්වන සියවසට පිවිසෙන්නට සූදානම් වීමේදී මෙකී ප්‍රවනතාවයන් කෙරෙහි විශ්වවිද්‍යාල පද්ධතියේ වැඩි අවධානය යොමුවිය යුතු අතර පෞද්ගලික අංශයේ රැකියාවන් සඳහා මෙන්ම, ස්වයං රැකියාවන් සඳහා අවශ්‍ය වන දැනුම හා පුහුණුව ඇති මිනිස් බලය සපයා දීම කෙරෙහි විශ්වවිද්‍යාලවල අවධානය යොමුවිය යුතුව තිබෙනවා.

පවතින ප්‍රතිපත්තිය වෙනස් කර කෙසේ වත් ආපසු ගමන් කළ නොහැකි අතර, මේ රටේ උසස් අධ්‍යාපන ආයතන නව ආර්ථිකයට හා සමාජ පැවැත්මට අනුකූලව සකස්විය යුතුයි. ඒ නිසා මෙම අංශය ගැන සුපරීක්ෂාකාරී අධ්‍යයනයක් කළ යුතු අතර පෞද්ගලික අංශයේ මෙන්ම ස්වයං රැකියා ක්ෂේත්‍රවල වැඩිවන ඉල්ලුම සපුරාලීමට උසස් අධ්‍යාපන ආයතන සූදානම් විය යුතුයි. මේ රටේ දැඩි ඌනතාවයක් පවතින ක්ෂේත්‍රවලින් එකක් කලමනාකරන ක්ෂේත්‍රයයි වර්තමානයේදී අප විද්‍යාව, කෘෂිකර්මය, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හා නීතිය සම්බන්ධ-යෙන් දක්වන අවධානයට සමාන නැතහොත් ඊට වැඩි අවධානයක් අනාගතයේදී කළමනා-කරනය සම්බන්ධයෙන් දක්වන්නට සිදු වෙනවා. අද රටේ ඉල්ලුම අනුව ඇත්ත වශයෙන්ම මොවුන් ලබා ඇති ඉගෙනුමට වඩා වැඩි වැඩ කොටසක් ඉටු කිරීමට මොවුනට සිදු වන නිසා මෙම වෘත්තීය පුද්ගලයන් තුල කලමනාකරනය පිළිබඳ අවබෝධයක් හා එහිලා ප්‍රවනතාවයක් තිබීම අවශ්‍ය වනවා. අන්තර් ශික්ෂණ අධ්‍යයනයක් උනන්දු කළයුතුයි. උදාහරණයක් වශයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහිත ඉංජිනේරුවන් දැක්විය හැකියි.

විශ්වවිද්‍යාල විසින් තමන්ගේ නව ක්‍රියාදමය ගැන අවබෝධයක් ලබාගත යුතුවන අතරම මේ රටේ පෞද්ගලික අංශයක් උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අවබෝධ කරගත යුතු වැදගත් කරුණක් තිබෙනවා, එනම් තමන්ගේ අනාගත මිනිස් බල අවශ්‍යතාවයන් සපුරන්නේ මෙම ආයතන බවයි. ඒ නිසා මේ දෙපාර්ශවය විසින් ඔවුනොවුන්ගේ අපේක්ෂාවන් පරිදි දැනුම වර්ධනය කිරීම සහ ප්‍රබල අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ගොඩනගා ගතයුතුයි. ඒ දෙපාර්ශ්ව-යේම අන්‍යොන්‍ය සුබ සිද්ධියට හේතු වනවා ඇත. බටහිර රටවල ඉතා සුලබ දෙයක් වන මේ ලක්ෂණ තුන්වන ලෝකයේ ඇතැම් රටවල මෙන්ම ඉන්දියාවේ පවා පවතිනවා. උසස් අධ්‍යාපන ආයතන වලට ප්‍රධානයන්, භාරකාරත්වයන්, අලුතින් විද්‍යාල සහ ආයතන පිහිටුවීම සහ විවිධ අංශ සහ පරිත්‍යාගයන් වැනි විවිධ මාර්ග වලින් උසස් අධ්‍යාපනයෙහි උන්නතියට වැදගත් සේවයක් පුද්ගලයින්, ව්‍යාපාරිකයින්, කාර්මික හා වාණිජ සමාගම්, පෞද්ගලික ආයතන සහ අනුබද්ධ ආයතන විසින් ඉටු කිරීමට පුළුවනි. විශ්වවිද්‍යාල පැත්තෙන් බලන විට ඒවා සතු විශේෂඥ දැනුම යොදගෙන පෞද්ගලික අංශයේ ආයතන වෙනුවෙන් උපදේශකත්ව සහ පර්යේෂණ කාර්ය භාරයන් වල නිරතවීමට පුළුවන්. මේ ආකාරයට තම නඩත්තුව සහ වැඩි දියුණුව සඳහා රජයෙන් පිරිනමන ආධාර මුදල් ගැන අඩුවෙන් බලාපොරොත්තු තබා කටයුතු කිරීමට විශ්වවිද්‍යාලවලට පුළුවනි. රජය විසින් ලබාදිය හැකි මුදල රඳා පවතින්නේ වෙනත් ප්‍රමුඛතාවයක් මත බව තේරුම් ගතයුතුව තිබෙනවා. කිසිදු රජයකට පුළුවන් කමක් නැහැ දෙන මුදල් ස්ථිර වශයෙන් නිතිපතා දෙන බවට සහතික වන්නට. ඒ නිසා ස්වෝත්සාහ-යෙන් අතිරේක ආදයම් ලබාගැනීමට සෑම උත්සාහයක්ම විශ්වවිද්‍යාල විසින් දැරිය යුතුයි. මුදල් ආධාර ගැන අඩු බලාපොරොත්තු තබා කටයුතු කරන විට අනාගතයේ දී මතුවීමට ඉඩ ඇති නොයෙකුත් බලවේග හමුවේ තමන් ඉතා අගය කරන ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට විශ්වවිද්‍යාල වලට හැකිවෙනවා. පසුගිය කාලයේදී අපගේ ආර්ථිකය දැඩි පීඩනයට පත්කරමින්

විදේශ තාක්ෂණික ඥානය ලබාගැනීමට අපට සිදුවුනා. ඒ නිසා අපගේම පර්යේෂණ ප්‍රයත්නයන් වැඩි දියුණු කිරීමේ තීරණාත්මක අවධියකට අප එළඹ සිටිනවා. ඒ මාර්ගයෙන් අපගේ තාක්ෂණික හැකියාවන් වර්ධනය කරගෙන අපගේ සම්පත් වලින් උපරිම මට්ටමක ප්‍රයෝජන ලැබීම සඳහා අපට සුදුසු තාක්ෂණ ක්‍රම සොයාගත හැකිවෙනවා යයි සිතිය හැක.

ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් පිළිගත් විද්‍යාඥයින් අප බිහිකර තිබෙන බව ඇත්තයි. එහෙත් එපමණකින්ම අප සෑහීමකට පත්ව නිශ්චල නොවිය යුතුයි. මූලික පර්යේෂණ කටයුතු ඇත්ත වශයෙන්ම නොවැදගත් නොවන නමුත්, වැය කරන මුදලට හොඳ ප්‍රතිලාභයක් ලැබීමට නම් අපගේ සම්පත් ප්‍රායෝගික පර්යේෂණ වලට භාජනය කිරීම ගැන අවධානය යොමු කළ යුතුයි. දැනුම සම්බන්ධයෙන් උසස් මට්ටමක පර්යේෂණ වලින් වඩාත් යහපත් ප්‍රතිඵල ලබාගන්නට පුළුවන් වන්නේ අපගේ සම්පත් වලින් හැකි උපරිම ප්‍රයෝජනයක් ලබාගත හැකි විද්‍යාත්මක සහ තාක්ෂණික මූලික සැලසුම් සම්පාදනයකින් පසුව පමණි.

ඕනෑම රටක ප්‍රගතියට සහ සංවර්ධනයට මූලික වන්නේ පර්යේෂණ කටයුතුයි. ඉතා වැදගත් ඇතැම් ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු අඩපණ වීමද්දී අවධානයට භාජනය විය යුතු කරුණක්. මේ රටේ පර්යේෂණ කටයුතු වලින් බොහොමයක් ඇප කැපව සිටින එක්තරා පුද්ගලයින් කිහිප දෙනෙකුට පමණක් සීමා වී තිබීම කණගාටුවට කරුණක්. මේ අංශයෙන් සළකා බලන කොට ලාබාලම විශ්වවිද්‍යාලය වුවත් නිදහස් දින පිරිනමන ලද "විද්‍යානිධි" සම්මානයෙන් පුදනු ලැබූ හය දෙනාගෙන් සතර දෙනකුම රුහුණ විශ්වවිද්‍යාලයයේ ආචාර්යවරුන් වීම ගැන මා සතුටු වෙනවා.

අපගේ දේශීය සම්පත් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ ඒවා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් විශාල හිස් බවක් පැවතීම ඉතාමත්ම කණගාටුදායක කරුණක්. කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි විශාල ජයග්‍රහණයක් අප අත්කර ගෙන තිබුණත්, අපගේ ඛණිජ සම්පත් ගැන එසේ කියන්නට පුළුවන් කමක් නැහැ. සංවර්ධනය වෙමින් පවත්නා ලෝකයේ වෙනත් රටවල් සමග සංසන්දනය කළත් අප පොහොසත් රටක් නොවෙයි. බ්‍රසීලය, චීනය නැතහොත් ඉන්දියාව වැනි රටක තිබෙන ස්වාභාවික සම්පත් අපට නැහැ. ඒ නිසා තිබෙන ස්වල්පයෙන් උපරිම ප්‍රයෝජන අප ලබාගත යුතුයි. යටත් විජිත කාලවල මෙන් විදේශිකයින් විසින් අපව සූරා කන්නට ඉඩ හරිමින් තව කොපමණ කාලයක් අපි අපගේ සම්පත් අමු ද්‍රව්‍ය වශයෙන් පිටරට යවමුද? එක් අභාග්‍ය සම්පන්න උදහරණයක් මම ගෙන හැර දක්වන්නම්, තාප භාවිතයෙන් ලෝකයේ හොඳම නිල් මැණික් කැට බවට පරිවර්තනය කළ හැකි ගෙවුඩ වැඩි ප්‍රමාණයක් ඇති පතල් ශ්‍රී ලංකා පොළොවේ තිබෙනවා. නමුත් කාලයක් මුළුල්ලේ ඒ ගැන මොනවද අප කර තිබෙන්නේ. ඒවා අප ආපසු පතල් වලටම විසි කළා. 1978 න් පසු තායි ජාතිකයින් රොතු පිටින් පැමිණ මෙම ගල් තොග ගණන් මිලයට ගෙන තායිලන්තයට හොරෙන් පිටමං කරන තුරුත් අපගේ විද්‍යාඥයින් මේ ගැන කිසිවක් දැනගෙන සිටියේ නැහැ. මේ නින්දෙන් අපි අවදි වන විට කල්ගත වෙලා වැඩියි.

අප දුලිනාට එම කටයුත්තෙ යෙදුනානම් ඇතිවන තත්ත්වය කෙතරම් වෙනස්වන්නට තිබුණාද? ගෙවුඩ සම්බන්ධයෙන් වගේම ටිනිරන් ඉල්මනයිට් සහ ඇපටයිට් වැනි අපගේ වෙනත් වාණිජ සම්පත් ගැන පර්යේෂණ පැවැත්වුවහොත් වැඩිවනත් ආදයම් මාර්ග සොයා ගැනීමට අපට හැකිවෙයි.

මෙහිදී තවත් එක් කරුණක් සඳහන් කරන්නට මා කැමතියි. පර්යේෂණ කටයුතු ද්විත්ව කරණයක් වැලැක්වීම පිණිස විශාල සංඛ්‍යාවත්වූ පර්යේෂණ ආයතන හා විශ්වවිද්‍යාලයන් අතර වඩා සම්බන්ධීකරණයක් පර්යේෂණ කටයුතුවලදී ඇතිකරගත යුතුයි. පර්යේෂණ කටයුතු කරන නිශ්චිත ක්ෂෙත්‍ර තෝරා බේරා ගෙන සෑම ආයතනයක්ම තම ධනය සහ ශ්‍රමය තෝරාගත් ක්ෂෙත්‍රයට පමණක් යොමු කළ යුතුයි. එකම ක්ෂෙත්‍රයක පර්යේෂණ කටයුතුවලදී තරඟකාරීත්-වයක් ඇති කිරීමට තරම් අප සතු සම්පත් ප්‍රමාණවත් නැත.

පර්යේෂණ කටයුතු දිරිගැන්වීමට සහ වැඩිදියුණු කිරීමට නම්, පීඨවල උසස්වීම් සියල්ල, කර ඇති පර්යේෂණ ප්‍රමාණය මත රඳා පවතින බටහිර රටවල සහ ඕස්ට්‍රේලියාවේ විශ්වවිද්‍යාල-වලට පොදු එම ක්‍රමය මෙරට විශ්වවිද්‍යාලවලත් අනුගමනය කිරීම වැදගත් වෙනවා. උසස් වීම් සඳහා මිනුම් දණ්ඩ කරනු ලබන පර්යේෂණ ප්‍රමාණය වෙතොත් එයින් ලැබෙන ඵලය සැලකිය යුතු අන්දමින් වැඩිවනවා ඇත. එවිට පර්යේෂණ කටයුතු සඳහා වැය කරනු ලබන මුදල් නිසියාකාර පාලනයකින් යුතුව මැනවින් වැය කරනු ලබන්නේ නම් වැඩි පුර අරමුදල් ප්‍රතිපාදනය යුක්ති සහගත වනවා ඇත.

පසුගිය කාලවල අධ්‍යාපනය සලකනු ලැබුවේ සාමාජයීය ප්‍රතිලාභයක් වශයෙනි. දැන් එය සලකනු ලබන්නේ ආර්ථික සහ සාමාජියීය ප්‍රගතියට දීර්ඝ කාලීන වශයෙන් වැදගත් ඵල ගෙන දෙන මානව සම්පත් ආයෝජනයක් වශයෙනුයි. ඈත අතීතයේ උසස් අධ්‍යාපනය තෝරාගත් ටික දෙනකුගේ ප්‍රයෝජනය සඳහා වෙන්වුනු එකක් වුනු අතර රටේ අවශ්‍යතාවයනට එක එල්ලේම සම්බන්ධ වුනේ නැහැ. උසස් අධ්‍යාපනය වඩාත් පුළුල් පදනමක පිහිටා තිබෙන සහ ඒ වෙනුවෙන් විශාල මුදල් සම්භාරයක් වැය කරන වර්තමානයේ, එය රටේ සංවර්ධන අවශ්‍යතාවයනට වැදගත් වන ඵලදායිත්වයක් කරා යොමුව පවතිනවා.

වැඩිමනත් වෘත්තීය දැනුමක් ඇත්තවුන්, කාර්මික ශිල්පීන් සහ කාර්මික සේවකයින් මුල් කොට ගත් කාර්ය ක්ෂෙත්‍රයකට යොමුවීම අරමුණු කොට වර්ධනය වන්නාවූ ආර්ථිකයක් විසින් අවශ්‍ය වන්නාවූ පුහුණු පිරිස ලබාගත හැකිවනු පිණිස සැලසුම් කළ අධ්‍යාපන රටාවක් අනුගමනය කළ යුතුයි. ආර්ථික වර්ධනය බාල කළහැකි මිනිස්බල ඌනතාව මෙන්ම අධ්‍යාපනික සම්පත් අපතේ යාහැකි, රැකියා නො මැතිකමට තුඩු දියහැකි සහ උගතුන් අසහනයට පත් කළ හැකි මිනිස්බල අතිරික්තය අප වැලැක්විය යුතුයි. අවශ්‍ය පුහුණුව මුලින්ම නිශ්චය කරගෙන ඒ සඳහා අප සැලසුම් කළයුතුයි. විවිධ ක්ෂෙත්‍රවල පුහුණු කරන ප්‍රමාණය සහ ගුණාත්මක අවශ්‍යතාවයන් සැලසුම් කොට මෙම ක්ෂෙත්‍රවල පුහුණු මිනිස්බල අවශ්‍යතාවයන් නිශ්චය

කරගත යුතුයි. ඉන් පසුව, ඒ සඳහා අවශ්‍යතාවයන් අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් කළ යුතුයි. එසේ නොකළහොත් අපගේ සාමාජයීය රටාව කෙරෙහි විනාශකාරී ප්‍රතිඵල ඇති වනවාත් හැර අපගේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩු ක්‍රමය සහ සම්ප්‍රදයයන් නොකඩවා පවත්වාගෙන යාමට එය තර්ජනයක් වනු ඇත.

ප්ලේටෝගේ ඇකඩමිය, තක්සිලාව සහ නාලන්දව සහ අපගේම මහා විහාරය අභයගිරිය සහ ආලාහන පිරිවෙන සතුව තුබු ශ්‍රේෂ්ඨ සම්ප්‍රදයන් හී පිහිටා බලූන කළ විශ්වවිද්‍යාලයක් ආලෝකයේ හා අධ්‍යාපනයේ ක්ෂෙත්‍ර ස්ථානයක් විය යුතුයි. එනම්, මේ රටේ වසර 2500 ක් පැරණි විශිෂ්ඨවූත් අඛන්ඩ වූත් සංස්කෘතියකට හිමිකම් තිබෙන. අපි අපගේ සංස්කෘතියේ ඇති හොඳම අංග ලොව පුරා පවත්නා වෙනත් සංස්කෘතීන් සමඟ සසඳා සෑම කෙනෙකුම සෑහීමකට පත්වන සංස්කෘතික සංකලනයක් ඇති කළයුතු වෙනවා. රුහුණ විශ්වවිද්‍යාලය පිහිටා තිබෙන්නේ විශිෂ්ඨත්වයෙන් කිසිවකු නොදෙවෙනි වන පරිදි මහා සමුද්‍ර කඳු, විල්, සහ කුඹුරු වල සුන්දරත්වය එකට කැටි වුණු චමත්කාර පරිසරයකයි. මෙය ලෝකයේ අලංකාරතම විශ්වවිද්‍යාලවලින් එකක් වන අතර වැල්ලමඩම මෙම භූමි භාගය තෝරා ගැනීමේ හවුල් කරුවෙක් වීමට ලැබීම ගැන මම සතුටු වෙමි. මෙතරම් සුන්දර පරිසරයක පිහිටා තිබෙන රුහුණ විශ්වවිද්‍යාලය දිනෙන් දිනම දියුණුවෙන් දියුණුවට පවත්වේවා! රුහුණ විශ්වවිද්‍යාලය මෙරට ශ්‍රේෂ්ඨතම විශ්වවිද්‍යාලය බවටත් ලොව මෙදෙස පිහිටි ශ්‍රේෂ්ඨතම විශ්වවිද්‍යාලවලින් එකක් බවටත් පත්වේවා. ඉදිරි සියවස් ගනනාව තුළ ශ්‍රී ලාංකික පරම්පරාවන්ගේ ජීවිතය රුහුණ විශ්වවිද්‍යාලය විසින් යහමගට යොමු කෙරේවා.

## *Hon. Ronald Joseph Godfrey de Mel*

*Presented by the Vice-Chancellor*

*Professor G. P. Samarawickrama*

*Revd. Chancellor,*

I have the honour, and it is with great pleasure that I present to this convocation Mr. Ronald Joseph Godfrey de Mel, the Hon. Minister of Finance and Planning of the Democratic, Socialist Republic of Sri Lanka, and the creator of the University of Ruhuna, on whom the Senate and the Council of the University of Ruhuna on the unanimous recommendation of the Faculties of Humanities and Social Sciences, Medical, Agriculture, and Science have decided to confer the Degree of Doctor of Letters *honoris causa*, for the distinguished services he has rendered, generally to Sri Lanka, and especially to Ruhuna, by establishing the University of Ruhuna.

Mr. Ronald Joseph Godfrey de Mel is learned, a fine orator and a man of exceptional honesty, remarkable wisdom and courage. That the strength of will he possesses overcomes all obstacles that confront him, is a distinct characteristic of his life. He was born on the eleventh day of April 1925, and having successfully completed his primary and secondary education at St. Thomas College, Mt. Lavinia with distinctions, he entered the University of Ceylon

where he obtained a Degree in History with first class honours in 1947. He came first in every public examination he sat for in Sri Lanka, indicative of his single minded and successful pursuit of wisdom.

After his graduation from the University of Ceylon with honours in History, he registered for a Ph.D. Degree in 'International Finance and International Trade' at the University of Cambridge in England. He had to discontinue his post-graduate studies as he was admitted at that time into the Ceylon Civil Service, the elite higher administrative corps of Sri Lanka.

Mr. de Mel who joined the Ceylon Civil Service in 1948 has served in several important government Departments as their Head and as the Permanent Secretary of several important Ministries. He carried out the duties and responsibilities attached to these offices with distinction and remarkable efficiency, thus illuminating those offices in the real sense of the word, and gaining much honour to himself as well.

After fourteen years of excellent service he bade farewell to the Ceylon Civil Service, sacrificing a lucrative government pension, and took to active politics with the earnest desire to serve his country and its people. He was elected member of Parliament for Devinuwara in three successive general elections in 1967, 1970 and 1977. He presently represents the Bulatsinhala electorate in Parliament. He was appointed Minister of Finance in 1977 and continues to grace this office upto date. He has been the chief architect of the most far reaching economic and financial changes in Sri Lanka since Independance in 1948. He also represented Sri Lanka at several international conferences, and was elected Chairman, Board of Governors, Asian Development Bank in May 1985.

In private life Mr. de Mel has been a Director of some of the largest tea and rubber plantations and industrial companies in Sri Lanka. He has also been a pioneer rural development worker and was one of the founder members of the Sri Lanka Jatika Shramadana-Sarvodaya Movement, which has been carrying out a basic needs programme among the poorest of the rural poor on a voluntary self-help basis since 1950's.

*Revd. Chancellor,*

I have the honour to request you, to confer the Degree of Doctor of Letters *honoris causa* upon Mr. Ronald Joseph Godfrey de Mel, the Hon. Minister of Finance and Planning of the Republic of Sri Lanka, a scholar with sound knowledge of the history and culture of our people and of International Finance and International Trade, and who since 1967 strove very strongly within and without Parliament for the establishment of a University in Ruhuna, the birth place of learned and wise men of olden as well as modern days, and finally achieved his goal : the establishment of an attractive University complete with all facilities for the good of all Sri Lankans.

# *Convocation Address*

*by*

## *Hon. Ronnie de Mel*

*Minister of Finance and Planning*

*Venerable Chancellor, Venerable Sirs, Vice Chancellor, Members of the Senate and Board of Management, Deans, Professors, Lecturers, Students, Ladies and Gentlemen,*

I was deeply moved both by what your Vice Chancellor said about me in his opening address and by the generosity and graciousness with which you welcomed me into your midst and made me one of yourselves by conferring on me the degree of D. Litt. *honoris causa* of the University of Ruhuna.

I shall always prize the honour not only because I have been in the forefront of the long struggle for the establishment of the University of Ruhuna, but also because it is an honour bestowed by an Institution which to me represents the unconquerable spirit of the sons and daughters of the South who by their achievements in every major sphere of activity have greatly enriched the political, economic, cultural and social life of this land.

Sri Lanka's modern Higher Education system could be said to have begun in 1921 with the establishment of the Ceylon University College, which was affiliated to the University of London. The transition of this institution to a National University granting its own degrees took all of 21 years, for it was only in 1942 that the University of Ceylon was established. In 1959 the two main centres of Buddhist learning with a long tradition of scholarship, the Vidyalankara and Vidyodaya Pirivenas were converted into Universities and are today known as the University of Kelaniya and the University of Sri Jayewardenepura. In 1972 the Ceylon College of Technology at Katubedde was elevated to University status and

became the University of Moratuwa in 1979. In the same year, the University of Jaffna was established after first being set up as a campus of the University of Ceylon in 1974. Your own University - the University of Ruhuna-was elevated to University status in 1984 after its early beginnings in 1978. Higher education in Sri Lanka did not end with the establishment of these institutions. Today, we have in addition, the Batticaloa University, the Open University, the Colombo North Medical College, the Sir John Kotelawala Defence Academy, the Undergraduate Institutes of Aesthetic Studies, Workers' Education and Indigenous Medicine as well as the Post Graduate Institutes of Medicine, Agriculture and Pali and Buddhist Studies.

Consequent on the Gnanalingam Committee Report on Technical Education in 1979, the technical education sector which had hitherto been neglected and starved of funds was given a new lease of life. Its recommendations led to the establishment of new technical institutes and affiliated technical units, the introduction of new courses and improvement of existing ones, and systematic staff development.

For a developing country like Sri Lanka with its very limited resources the establishment of so many institutions of higher education is, I think, a remarkable achievement and I am proud to say that most of the credit for this must go to the J. R. Jayewardene Government. Further, till we removed the obnoxious bureaucratic controls of the University of Ceylon Act No. 1 of 1972 and gave the Universities back their administrative autonomy and academic freedom, higher education, like the economy we inherited, was in the doldrums. It was only after the Universities Act of 1978 that the light of learning was re-kindled and Higher Education took its rightful place in the educational system of this country.

Today. higher education is not confined to the elite or the affluent. With the regional distribution of Universities, more and more students from lower middle class and working class homes have been provided with access to higher education - access which was previously denied them due to the existence of only a few institutions and restrictions on the number of admissions. In addition, Scholarships and Bursaries have greatly eased the burden of less affluent parents who would otherwise not have been able to finance the higher education of their children.

From the very beginning the J. R. Jayewardene Government earmarked a very significant portion of the budgetary resources to education at all levels. We inaugurated the biggest development programme in the history of this country because more and more development is the only answer to our problems. Only development can give employment to our youth, raise the living standards of our people and improve the quality of their lives. But development cannot be achieved without education. It is only through education that our manpower can be taught the necessary skills and our resources can be utilised to their optimum levels. That is why we have always placed such great emphasis on education and diverted our scarce resources to improving it in every possible way.

I would at this stage like to illustrate my remarks with a few figures.

Total admissions to all the Universities have increased from 4150 students in 1977 to 6000 students in 1986 and total enrolment has increased from 15,000 in 1977 to 20,000 in 1986. If we include students in the Open University and the Undergraduate and Post-graduate Institutes, the present total is nearly 34,000. In the technical colleges the intake has increased from 10,000 in 1979 to 15,000 in 1986. Could any Government have done more?

Let me now turn to expenditure on higher education. Unlike in Western countries, in Sri Lanka the entire funding is by the State. Today, Rs. 5200 million or 7.5 % of the total budget has been allocated to education. This is ten times the sum allocated to the last Government. The current year's grant for higher education alone is Rs 1,000 million or Rs 1 billion! Ever since the J.R. Jayewardene Government came to power in 1977, there has been a steady increase in the funds allocated to higher education.

This increase of expenditure on higher education in such a short period of time is unprecedented in the annals of education in this country. I think the time has now come for us to pause and reflect on whether this money has been well spent. Are we achieving the goals we sought when we embarked on such an ambitious programme? Is higher education serving the case of development? If not are there ways in which it can be improved to get better results? You will admit that we cannot afford to continue this massive expenditure in the context of our present budgetary constraints unless we are satisfied that these institutions are delivering the goods.

I am pleased to note that there is clear evidence that higher education in this country is finally moving in the right direction. For the first time we have a Corporate Plan for University Education covering the years 1984 - 1988. This plan envisages a shift away from Arts and Humanities which dominated university education in the past, to science, professional, management and business studies. It also marks a more effective diversion of resources from an over concentration on undergraduate teaching to postgraduate teaching and research. The new concept of setting up centres of excellence and the rationalisation of faculties in the University System are also to be commended. These are all very healthy signs and need every encouragement from all those associated with University education.

It is evident that the University Grants Commission is making a sincere effort to reform and rehabilitate higher education to serve the country's future needs. However, there are some areas which requires greater attention if we are to achieve our Higher Educational objectives in the quickest possible time, and I would like to deal with some of them today.

All these years Higher Education in this country was geared to providing the manpower necessary to man the public sector. The private sector usually recruited its personnel either direct from schools or from private educational and professional institutions. If we are to be successful in our leap into the 21st Century - something which is talked about a lot these days - a dramatic transformation is necessary in our University System. Now that the Government has completed a large number of infrastructural projects which were too large for the private sector to handle, it has realised that the time has come for a structural change in the utilisation of resources. The public investment programme for the next five years envisages a total contribution of Rs 291 billion of which the private sector's share is Rs 136 billion. But what is significant is the fact that the private sector's share is gradually increasing so that in the 5th year its share is greater than that of the public sector.

The government has recognised the fact that development can be accelerated in the future only if a greater role is assigned to the private sector. This is further underlined by the government's commitment to privatisation of certain public sector industrial and commercial institutions. So if we are to prepare for the leap into the 21st century, the University system should pay greater attention to these trends and start immediately to gear itself to providing the the manpower with the necessary knowledge and skills for employment in the private sector as well as for self employment.

There is no going back on this policy: so the higher education institutions of the country really have to adjust to the new economy and the new society. Therefore, this aspect must be carefully studied and institutions of higher education must prepare themselves to meet the ever increasing demands of the private and self employment sectors. One of the areas where there is a tremendous dearth of talent in this country is in the sphere of management. In future, management studies will need the same amount, if not more, of the attention presently paid to science, agriculture, medicine, engineering and law. Indeed, today's demands are such that these professionals require to be management-oriented in their respective callings for many of them are increasingly called upon to play much wider roles than their disciplines have equipped them for. Inter disciplinary studies must be encouraged more and more-for example engineers with M.B.A, etc.

Just as much as the Universities must recognise their new role, the private sector of this country must also realise that they too have an important stake in higher education for it is from these institutions that their future manpower will be drawn. Therefore it is time that a strong linkage is established between the two, so that they can enrich each other and through their interaction be of mutual benefit. This is very common in the West, and even in India and some third world countries. Individual businessmen, industrial and commercial companies, private institutions and allied organisations can all play an important role by providing assistance to institutions of higher education in various ways such as the provision of awards, trusts, financing the setting up of new colleges and institutions and providing endowments for various Chairs. Universities on their part should use their expertise to undertake consultancy and research assignments for private sector institutions. In these ways Universities could be less dependent on Government grants both for their maintenance and

their improvement. It must be realised that what monies the Government can release will be entirely dependent on its other priorities. No government can guarantee constant regular commitments; so, Universities must make every effort to raise additional revenue on their own. Less financial dependency will also give them greater strength to maintain their much cherished autonomy in the face of any pressures that may develop in the future. We have in the past depended far too slavishly on the import of foreign technical knowhow at great cost to our economy. It is high time that we made a decided effort to improve our research effort and through it our technical capacities and evolve our own appropriate technology to exploit our resources to optimum levels.

It is true that we have produced internationally famous and recognised scientists. But this should not lull us into a sense of complacency. While fundamental research is certainly not unimportant we must concentrate more of our resources on applied research if we are to get the best value for our money. Research in the more rarefied and higher reaches of knowledge can be of much greater benefit to us if it is undertaken after we have built up a sound infrastructure of scientific and technical capacity capable of exploiting our resources to the highest levels possible.

Research is fundamental to the progress and development of any country. The paucity of research in certain very important fields is therefore a matter of serious concern. It is a pity that most of the research output in the country is restricted to the efforts of a few dedicated individuals. In this context I am glad that despite being one of the youngest universities, 4 out of the 6 university recipients of Vidya Nidhi Awards on Independence Day went to teachers of Ruhuna University.

It is very unfortunate that there is a very large vacuum in the research and development of our indigenous resources. Though we have had considerable success in the field of agriculture, the same

cannot be said as far as our mineral resources are concerned. We are not a rich country even in comparison to others in the developing world. We do not have the natural resources of a Brazil, a China or a India. Therefore we must make the best use of the little that we have. I ask you, how long are we going to export our resources in the raw form as we did in the days of our colonial past and allow ourselves to be exploited by the foreigner? Let me cite a very tragic example. The soil of Sri Lanka contains the world's largest reserves of geudas which through heat treatment can be transformed into the best sapphires in the world. But what were we doing with them all these years? We were throwing them back into the pits! Our scientists were blissfully ignorant of its possibilities till the Thais came in droves after 1978, purchased large quantities of these stones and smuggled them out to Thailand. When we did wake up from our slumber we were far too late. How different the situation would have been had we got there first! Just as in the case of geudas I am sure that concentrated research on our other mineral resources, like graphite, ilmenite, apatite for example, could very well result in our obtaining much greater added value.

There is one other matter I would like to mention in this connection. Much greater co-ordination is needed between the large number of research institutions and the universities to avoid duplication and overlap of research effort. Specific areas of activity must be clearly identified and demarcated and each institution should confine its money and effort to its respective area. Our resources are too limited for competition between institutions, in the same field.

If research is to be encouraged and developed it is vital that universities in this country adopt the system common to universities in the West and in Australia where promotions in the faculty depend entirely on the quantum of research done. If research is made the

criteria for promotion I am sure that output will increase considerably. It will then justify increased allocation of funds, for money spent on research - provided it is properly monitored - is always money well spent.

In the past, education was regarded merely as a social benefit. Today it is considered an investment, an investment in human resources which in the long run contributes significantly to both economic and social progress. In bygone times higher education was a luxury item of consumption for a selected few and output was not directly related to a country's needs. Today when higher education is more broadbased and vast sums of money are being expended, it is vital that output is geared to the developmental needs of the country.

A growing economy which is expected to undergo a shift in occupational structure towards more professionals, technicians and industrial workers, must follow a defined pattern of educational development to obtain the kinds of trained people it requires. We must avoid manpower shortages which may slow down economic growth and manpower surpluses which would be a waste of educational resources and lead to unemployment and frustration of the educated. It is essential that we first determine and plan for the skills required and, having planned for the quantity and quality of skills in different fields, we should then determine the output of skilled manpower required in these fields and thereafter work out the required inputs into the educational system. Otherwise, it could have disastrous efforts on our social fabric and threaten the continuance of our democratic policy and traditions.

A University must be a centre of light and learning in the best traditions of Plato's Academy, Taxila and Nalanda, and our own Mahavihara, Abayagiri and Alahara Pirivena to name only a few. You are heirs to a great and unbroken tradition of 2500 years of culture in this land. We must combine the past in our own culture with the cultures of the whole world and arrive at a synthesis that is satisfying to all. The Ruhuna University is sited in a campus

unsurpassed in its excellence, combining the beauty of the sea, the hill, the lake and the paddy field. It will be one of the most beautiful Universities in the world, and I am glad I had a share in the selection of this site at Wellamadama. In such exquisite surroundings, may the spirit of excellence grow and flourish and may the University of Ruhuna become one of the great Universities of this land and one of the great Universities of this part of the world, moulding the lives of generations of Sri Lankans for centuries to come.

රුහුණ විශ්වවිද්‍යාලය
18 AUG 2011
පුස්තකාලය - මාතර

PRINTED AT THE
SRI LANKA UNIVERSITY PRESS,
MORATUWA

# National Digitization Project

## *National Science Foundation*

Institute : University of Ruhuna

1. Place of Scanning : University of Ruhuna, Wellamadama, Matara
2. Date Scanned : 2017/12/19
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : Chamila Kanishk

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Senior Assistant Librarian

Name : Kusala Fernando

Signature : [signature]

Date : 2017/12/19

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*